# සපරගමු මහ සමන් දේවාලය ආශ්‍රිත ස්පර්ශිත හා අස්පර්ශිත උරුමයන් පිළිබඳ අධ්‍යයනයක්

කේ.ඒ. තුෂාරා අයිරාංගනී*

සපරගමු පළාතේ ඓතිහාසික ස්ථාන අතුරින් ශ්‍රී පාදස්ථානයට පමණක් දෙවැනි වූ මහ සමන් දේවාලය ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික වටිනාකමකින් යුත් පූජනීය ස්ථානයකි. රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දේවාලයගාව ග්‍රාම නිලධාරී වසමේ මහ සමන් දේවාලය පිහිටා තිබේ. දඹදෙණිය රාජ සමය දක්වා දිවයන ඉතිහාසයකින් යුක්ත මෙය (ක්‍රි.ව 1236-1271) දෙවන පැරකුම්බා රජුගේ රජ දවස ඉදිකරනු ලැබූවකි. ක්‍රි.ව 1618 දී සමන් දේවාලය ආශ්‍රිත සියලු ඉදිකිරීම් පෘතුගීසින් විසින් විනාශ කිරීමෙන් පසුව වර්තමාන සමන් දේවාලය සම්පූර්ණයෙන් ඉදිකරන ලද්දේ දෙවන රාජසිංහ රජුය. (ක්‍රි.ව 1629-1687) සුමන සමන් දේවියන් වෙනුවෙන් ඉදිකොට තිබෙන දේවාල අතරින් ප්‍රධාන දේවාලය ලෙස සැලකෙන්නේ මෙයයි.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ සපරගමු සමන් දේවාලයේ ස්පර්ශිත හා අස්පර්ශිත උරුමයන් සොයා බැලීමයි. දේවාල භූමියේ ඉපැරණි ස්මාරක, ඉතිරිව පවතින ඉපැරණි නෂ්ටාවශේෂ, සිතුවම්, උළුවහු, මකර තොරණ ඓතිහාසික හා වාස්තු විද්‍යාත්මක වශයෙන් වැදගත් වේ. දැනට ඉතිරිව පවතින පෘතුගීසි අවශේෂ ද පුරාවිද්‍යාත්මක වැදගත්කමින් යුක්ත ය. සමන් දෙවියන් වෙනුවෙන් සිදු කෙරෙන වාර්ෂික ඇසළ පෙරහැර දේවාලය හා බැඳුණු උත්කර්ෂවත් මංගල්‍යයකි. කප් සිටුවීමෙන් ආරම්භ වී දිය කැපීමෙන් පෙරහැරින් අවසන් වේ. මහ බඹාකෝලම දේවාල පෙරහැරේ සුවිශේෂී අංගයකි. සමන් දෙවියන් උදෙසා දෛනික සිදුකරන චාරිත්‍ර වාරිත්‍ර හා පුද පූජා ලාංකේය ජනයාගේ දේව භක්තිය ප්‍රකට කෙරෙන්නකි. දේශීය ජනයාගේ පමණක් නොව විදේශීය ජනයාගේ ද අවධානය යොමු වී තිබෙන සපරගමු මහ සමන් දේවාලය ලාංකේය සංස්කෘතිය විදහාපාන පූදනීය ස්ථානයකි. එබැවින් මෙවැනි ස්ථානයක් සුරක්ෂිත ව පවත්වාගෙන යාම සඳහා බලධාරින්ගේ අවධානය යොමු විය යුතු ය.

ප්‍රමුඛ පද :- සමන් දේවාලය, සමන් දෙවියන්, ස්පර්ශිත හා අස්පර්ශිත උරුමයන්

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය thusharairangani@gmail.com